# ආලෝකෝ උදපාදි

ඒ, 1986 වසරයි. විදුසර පුවත්පත පළ කිරීම ඒ වන විට ආරම්භ කොට තිබුණේ නැත. "දිවයින ඉරිදා සංග්‍රහයෙහි" විද්‍යා අතිරේකයක් වරින් වර පළ වුව ද එය මවිසින් මහත් උනන්දුවෙන් කියවන ලද එකක් නො වී ය. මා උසස් පෙළ අධ්‍යාපනය විද්‍යා විෂයය ධාරාවෙන් හැදෑරීම ආරම්භ කොට ගත වී තිබුණේ මාස කිහිපයකි. පාසලේ දී ඉගැන්වූ "විද්‍යාව" විභාගය ම ඉලක්ක කොට ගත්තක් වූ නිසා එය පාසලෙහි ම තබා හිස් අතින් (සිතින්) ගෙදර ආවෙමි. මා සොයා ගිය සත්‍යය ඒ විද්‍යාවේ නො වී ය.

ඉරිදා දිවයිනට අමතරව බදාදා දිවයිනත් මිල දී ගැනීම මපියාණන් විසින් ආරම්භ කරනු ලැබ තිබිණි. ඒ ඇයි දැයි මම නො දනිමි. කෙසේ වෙතත් පාසල් ඇරී හිස් අතින් ගෙදර එන මා හට කියවීමට දෙයක් එහි විය.

1986 විශේෂ අවුරුද්දක් විය. කාලයකට වතාවක් අවුරුදු 76කට වතාවක් පැමිණෙන අමුත්තකු නැවත අපේ අහසේ කරක් ගසමින් සිටීම එයට හේතුවයි. ඒ හේලි ගේ වල්ගා තරුවයි.

"හේලි ගේ යථාර්ථය" මැයෙන් ලිපියක් දිවයින බදාදා අතිරේකයෙහි පළ වී තිබිණි. එය ලියා තිබුණේ නලින් ද සිල්වා නමැත්තෙකි. මේ නුහුරු නුපුරුදු ලේඛකයා ගැන මම නො තැකුවෙමි. එහෙත් ඒ ලිපිය කිහිප වතාවක් නො කියවා සිටීමට මට නොහැකි විය. මේ "අලුත්" ලේඛකයා සතිපතා ම වාගේ බදාදා දිවයිනට ලියන්නට විය. "කාටීසීය තාප්පය" බිඳ දැමීමක් ගැන ඔහු ලිවී ය. නීල්ස් බෝර් ගැන කිහිප වතාවක් ම ලිවී ය. තමා වෙනුවෙන් පිරිනැමීමට නියමිත වූ සම්මානයක් සඳහා රූපාංකනයක් තෝරාගැනීමේ වරම නීල්ස් බෝර් හට හිමි වූ විට ඔහු ඒ සඳහා "යින් - යැං" සංකේතය තෝරාගත් බවක් ද එක් ලිපියක විය.

උක්ත ලිපිවලින් හෙළි කෙරුණු "විද්‍යාව" පාසලේ දී හිස මත පැටවූ විද්‍යාවට වඩා බොහෝ සෙයින් වෙනස් වූ එකක් විය. මේ "අලුත්" විද්‍යාව සිතීමට යමක් ඉතිරි කළේ ය. එවක් පටන් මා පාසලට ගියේත් පාසල ඇරී නැවත නිවෙස කරා ආවේත් හිස් අතින් (සිතින්) නො වේ. ආර්ය පර්යේෂණයක් වෙනුවෙන් මනස වෙහෙසෙන්නට විය. කාලයක් තිස්සේ සෙවූ දෙයක් හමු වුණා ය යන හැඟීමෙන් සිත පිරී තිබිණි. ඒ ගැන උදාන වාක්‍යයක් කීමට මෙතරම් කලක් ගත වුවත් ඒ ගැන කණගාටුවක් මා හට නො වේ. ඒ, මා සිටින්නේ ඉමහත් වූ ප්‍රීතියකින් වන බැවිනි.

ආලෝකය ඉපැදිණි, විද්‍යාව ඉපැදිණි, ඇස ඉපැදිණි.

මාස කිහිපයකට පසුව "මගේ ලෝකය" කියැවීමි. විදුසර ද පළ වන්නට විය. ඉතා ම අපහසුවෙන් උසස් පෙළ කඩඉම තරණය කළ මම කොළඹ විශ්වවිද්‍යාලයට ද රිංගා ගතිමි. වසර කිහිපයක් ඒ තුළ ඇවිද ගියෙමි.

මා "විද්‍යාවේදියකු" වුයේ විශ්වවිද්‍යාලයෙන් නො වේ. ඔවුන් ලබා දුන් කඩදාසිය මාගේ බඩගෝස්තරය සලසාගැනීමට පමණක් ප්‍රමාණවත් වෙයි. ඒ නිසා, එය පරෙස්සම් කොට තබාගත යුතු ය.

ඒ කඩදාසියෙන් නො ලැබුණ - ඉදිරියේ දීත් නො ලැබෙන, ආලෝකයක්, විද්‍යාවක්, ඇසක් වෙනත් චින්තනයක (අදහස් මාලාවක) සරණ යෑම නිසා මට හිමි විය. දැන් ඒ අදහස් මාලාවට නමක් වෙයි. ඒ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයයි.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය මට ප්‍රිය වන්නේ එය මතුර මතුරා සිටිය හැකි මන්තරයක් නිසා නම් නො වේ. ඒ තුළින් මට මා ගේ ගැටලු නිරවුල් කරගත හැකි බැවිනි. ඒ මගින් පවත්නා ගැටලුවලට විසඳුම් සලසාගත හැකි බැවිනි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි ලක්ෂණ ගණනාවක් වෙයි. එවා විශ්ලේෂණය කොට සංඛ්‍යාත්මකව මේ මේ යැයි දැක්වීමේ ශික්ෂණයක් මා තුළ නො වේ. පණ්ඩිතයකු නො වන මම සමස්තයක් වශයෙන් මා දකින දේ කීමට පමණක් ප්‍රිය කරමි.

"යථාර්ථය" නමැති කෙබරය ප්‍රතික්ෂේප කිරීම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය තුළ මා දකින ප්‍රධානතම ලක්ෂණයයි. දැනුම නිපදවන්නේ අප (මා) බව අපි (මම) දැන් දනිමු.(මි). බටහිරයන් විවිධ දවටනවල ඔතා එවන දැනුම ඒ ආකාරයෙන් ම පිළිගැනීමේ වුවමනාවක් මා තුළ දැන් නො වේ. ඔවුන් එම දැනුම නිපදවන්නේ ඔවුන් ගේ සංස්කෘතියට, කාලයට සාපේක්ෂව ඔවුන් ගේ වුවමනාවන් වෙනුවෙන් බව මම දැන් දනිමි. මා සිටින්නේ අපේ සංස්කෘතියෙහි ය. මේ කාලයේ අපට ඇත්තේ (තිබිය යුත්තේ) අපේ වුවමනාවන් ය. අපි අපේ වුවමනාවන් වෙනුවෙන් දැනුම නිපදවාගත යුතු වෙමු. අනුන් ගේ දැනුම ප්‍රතික්ෂේප කිරීමේ වුවමනාවක් අප තුළ නො වේ. එත් එවා ගෙට වද්දා ගැනීමේ ක්‍රමය ගැන අපි දැන් දනිමු.

බටහිරයන් දෙසාබාන දැනුම "යථාර්ථයක්" නො වන බව දන්නා අපි එවායේ වලංගුබව ප්‍රශ්න කරමු. එවා අපේ වුවමනාවන් හා නො ගැලපෙන විට අපි නව දැනුම නිපදවන්නෙමු. අප විසින් ඉස්මතු කරගනු ලැබිය යුත්තේ අපේ නිර්මාණාත්මකභාවයයි. මේ නව දැනුම (ඇත්තෙන් ම අපේ දැනුම) උපදවා ගත යුත්තේ ව්‍යවහාරික විද්‍යා විෂයය ලෝකයේ පමණක් නො වේ.

**වරුණ චන්ද්‍රකීර්ති**